**ශීර්ෂය 126 -** අධ්‍යාපන අමාත්‍යාංශය

-----------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය **126 -** අධ්‍යාපන අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ ජේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ජේද යොමුව |
|---|---|---|
| 1.6.1 (අ) | මිලදී ගැනීම්වල අගයන් හා ACA2i අගයන් සමාන විය යුතු වීම. | 1.6.1. (ආ) (ii) |
| 1.6.1. (ආ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක හා ඉකුත් වර්ෂයේ අවසාන මූල්‍ය වත්කම් ශේෂ | 1.6.1. (ආ) (i) |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබද සැසදුම් ප්‍රකාශය**
**පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | 2022 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ ගිණුම් සැසඳුම් ප්‍රකාශයේ පාලන ගිණුම් ශේෂය රු.2,805,377,162ක් වූ අතර කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයට අනුව එම ශේෂය රු.2,800,692,805ක් වේ. ඒ අනුව පාලන ගිණුම හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අතර රු.4,684,357ක වෙනසක් විය. | වෙනස නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | ඒකාබද්ධ ගිණුම් සැසදුම් ප්‍රකාශයේ පාලන ගිණුම් ශේෂය**,** කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ ශේෂය හා සමාන විය යුතුය. |
| **(ii)** | ඒකාබද්ධ ගිණුම් සැසඳුම් ප්‍රකාශයේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයට අනුව කේවල ශේෂ මුළු එකතුව රු.2,801,003,005 ක් වූ අතර භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂය රු.2,861,648,147 ක් වූයෙන් හා එම ශේෂ අතර රු.60,645,142 ක වෙනසක් පැවතුණි. | දිගු කාලයක සිට පැවත එන මෙම වෙනස නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | භාණ්ඩාගාර පොත් අනුව ශේෂය හා ඒකාබද්ධ ගිණුම් සැසඳුම් ප්‍රකාශයේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ ශේෂ සමාන විය යුතුය. |

**(ආ) දේපළ පිරියත හා උපකරණ**

**පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (i) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.172,273,922,034ක් වූ අතර 2022 ජනවාරි 01 දිනට එම ශේෂය රු.177,219,581,019 ක් වූයෙන් රු. 4,945,658,985 ක වෙනසක් නිරීක්ෂණය විය. | ගිණුම් පරීක්ෂා කිරීමේ දී රු. **4,945,658,985.00** ක වෙනසක් පවතින බව අනාවරණය කර ගෙන ඇති බවත් භාණ්ඩාගාරය හා සාකච්ඡා කර වෙනස විසදා ගැනීමට කටයුතු යොදා ඇති බව. | මූල්‍ය නොවන වත්කම්හි පෙර වර්ෂයේ අවසාන ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය සමග සැසඳී තිබිය යුතුය. |
| **(ii)** | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි **2022** වර්ෂයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වටිනාකම ලෙස රු.**3,722,761,428** ක් සදහන් කර තිබුණද අදාළ ප්‍රාග්ධන වැය විෂයයන් යටතේ වූ රු.**14,113,135,406** ක් වියදම් කර ඇති බැවින් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි මූලධන වත්කම් අත්පත් කර ගැනීම් රු.**10,390,373,978** ක් අඩුවෙන් දක්වා තිබුණි. | වෙනස රු. 10,390,373,978.00 ක් සඳහා බලපෑ අගයන් කිහිපයක් හඳුනාගෙන ඇති බවත් තව දුරටත් හඳුනා ගැනීමට නොහැකි වූ අගයන් භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් අංශය හා සාකච්ඡා කර නිවැරදි කර ගැනීමට කටයුතු යොදා ඇති බව. | මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම නිවැරදිව මූල්‍ය නොවන වත්කම් පිළිබද ප්‍රකාශනයට ඇතුළත් කළ යුතුය. |
| (iii) | 2022 ඔක්තෝබර් 25 දිනැති මාරු කිරීම් පත්‍රය අනුව ශීර්ෂ අංක 421 යටතේ පැවති නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයට අයත් රු.5,538,752,522 ක් වටිනා වත්කම් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා දී තිබුණද එම වත්කම් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට (ACA 6) ඇතුළත් කර නොතිබුණි. | මෙම සියළු වත්කම් ආරම්භක ශේෂයට ගලපා ඇති අතර එම අගයන්වල අපහැදිලිතාවක් ඇති බැවින් නිරවුල් කිරීමට භාණ්ඩාගාරය හා සාකච්ඡා කිරීමට කටයුතු කර ඇති බව. | පවරාගත් සියළු වත්කම් මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (iv) | SA 80, SA 82, ACA2( i ), මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය හා මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් වියදම් සාරාංශ යන ලේඛණ තුළ මූල්‍ය නොවන වත්කම් වටිනාකම් හි විවිධ වෙනස්කම් නිරීක්ෂණය වුවද එම වෙනස්කම් හා අදාළ ශේෂයන් තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇති බව. | මූල්‍ය නොවන වත්කම් වලට අදාල ශේෂයන් තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (v) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව 2022 වර්ෂය තුළ ආරම්භක ශේෂයට එකතු කරන ලද වටිනාකම්වලට අදාළව විගණනයට ඉදිරිපත් කරන ලද ලේඛනයේ ඇතුළත් රු. 3,082,959,009 ක තක්සේරු වටිනාකමක් සහිත ශේෂයක් මූල්‍ය නොවන වත්කම් පිළිබද ප්‍රකාශයෙහි | මෙම තක්සේරු වටිනාකම මත රු. 3,082,959,609.00 ක ශේෂය පිළිබඳව නිවැරදිව ප්‍රකාශ කළ නොහැකි අතර මාසික ගිණුම් සාරාංශ සැසඳීම අවසන් කර | මූල්‍ය ප්‍රකාශනවල ශේෂ ඊට අදාළ ලේඛනවල ශේෂ සමඟ සැසඳිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඇතුළත්ව නොතිබීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂයද එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම්ගත කිරීම් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | |
| (vi) | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සළුසල ශාඛාවේ පෙළපොත් ගංවතුරට හසුවීම සම්බන්ධයෙන් වූ රු.4,259,427 හානිය 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල කපා නොහළ ඉදිරියට ගෙන යන ශේෂයක් ලෙස ඇතුළත්ව නොතිබූ නමුත් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආරම්භක ශේෂය ලෙස දක්වා තිබුණි. | 2022 වර්ෂයේ විසර්ජන ගිණුම්වල එම අලාභය අත්වැරදීමකින් ඇතුළත් කර ඇති අතර, ඉදිරියේදී එය නිවැරදි කිරීමට කටයුතු කරමි. | සියළුම හානි, හානි හා පාඩු ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය |

**(ඇ)** **විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ඒකාබද්ධ ගිණුම් සැසඳුම් ප්‍රකාශයේදී කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව පාලන ගිණුමේ වර්ෂ අවසාන ශේෂ සමඟ සැසඳීමේ ප්‍රකාශයෙහි, පළාත් සභා ණය ශේෂ නිරවුල් කිරීම් ලෙස නැගෙනහිර පළාතට අදාළව එකතු කර ඇති රු.22,424,325 ක් හා අඩු කර ඇති රු. 48,909,855 ක් සැදුම්ලත් ආකාරය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | රු. 22,424,322 අදාළ තොරතුරු සොයමින් පවතින අතර එම තොරතුරු තහවුරු කරගත් වහාම අදාළ නිවැරිදි කිරීම් කිරීමට කටයුතු කරනු ලබන බව පළාත් සභා ණය ශේෂ නිරවුල් කිරීම් ලෙස දක්වා ඇති රු. 48,909,855 කට අදාළ ශේෂය තහවුරු කිරීමෙන් අනතුරුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බව. | ශේෂ තහවුරු කර ගැනීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය |
| (ii) | ඒකාබද්ධ ගිණුම් සැසඳුම් ප්‍රකාශයේ ඇතුලත් කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව සහ පාලන ගිණුමේ අවසාන ශේෂය අතර වෙනස ගැලපීම සඳහා වූ සැසඳුම් ප්‍රකාශය තුල ඇතුලත් හඳුනා නොගත් ශේෂය ලෙස සඳහන් ශුද්ධ අගය වූ රු.3,691,790 ක ණය ශේෂයන් වලට අදාල මූලාශ්‍ර ලියකියවිලි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම වෙනස්කම්වලට හේතු සොයා නිවැරදි කරන ලෙස අදාළ ගිණුම්කරණ ඒකක වෙත උපදෙස් ලබා දී ඇති බව. | වෙනස්කම් හඳුනාගැනීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (iii) | අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 31 කට 2023 මැයි 31 දින වනවිටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබා නොදුන් විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව. | විගණන විමසුම්වලට අප්‍රමාදව පිළිතුරු සැපයීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | පුනරාවර්තන වැය විෂයයක් හා ප්‍රාග්ධන වැය විෂයයක් යටතේ ලබා ගත් රු. 3,200,000,000 ක පරිපූරක ඇස්තමේන්තු මුදල සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | ණයවර ලිපි නිශ්කාෂණය 2023 වර්ෂයේ සිදුවූ බැවින් හා වර්ෂ අවසානයේ අක්මුදල් නොලැබීම මත ඉතිරි වී ඇති බව | පරිපූරක ඇස්තමේන්තු යටතේ මුදල් ලබාගැනීම හා උපයෝජනය නිසි කළමනාකාරිත්වයක් ඇතිව සිදු කළ යුතුය. |
| (ii) | අයවැය ඇස්තමේන්තුව යටතේ ප්‍රතිපාදන නොතිබු පුනරාවර්තන වැය විෂයයක් හා ප්‍රාග්ධන වැය විෂයයක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මත ලබා ගත් ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 90 ක් හා සියයට 93 ක් උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි. | අදාළ පරිපූරක ඇස්තමේන්තුව අනුමත වීම වර්ෂය අවසානයේ සිදු වූ බැවින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැතිවීම මත ඉතිරිවීම් සිදු වී ඇති බව. | පරිපූරක ඇස්තමේන්තු යටතේ මුදල් ලබාගැනීම හා උපයෝජනය නිසි කළමනාකාරිත්වයක් ඇතිව සිදුකළ යුතුය. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2017අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2(ඈ) ඡේදයට පටහැනිව 2022 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල රු.3,124,434,401 ක බැඳීමක්ද රු. 236,431,182 ක බැරකමක්ද ඇති කරගෙන තිබුණි. | 2022 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල රු.7,198,614,351 ක බැඳීමක්ද රු. 2,127,121,167 ක බැරකමක්ද ඇති කර ගෙන ඇති අතර ප්‍රාග්ධන බැඳීම් ලෙස සංවර්ධන වැඩ සටහන යටතේ 126-02-7-35-2509 (12) වැය විෂයය යටතේ දක්වා ඇති රු.2,410,132,070 ක බැරකම් වටිනාකම වැරදීමකින් ප්‍රාග්ධන ගිණුම යටතේ දක්වා ඇති බවත් අදාළ බැඳීම් වටිනාකම සංශෝධනය විය යුතු බව. | චක්‍රලේඛය ප්‍රකාරව බැඳීම් හා බැරකම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය යටතේ ඉංජිනේරු අංශයට වෙන්වී ඇති වැය විෂයන්ට අදාළව පැවති රු. 5,439,907,245 ක බැරකම් 2022 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීමට හෝ හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | තොරතුරු ලැබීම ප්‍රමාදවීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වී නොමැති බව. | සියළුම බැරකම් නිවැරදිව හෙළිදරව් කළ යුතුය. |

**2.3** ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්**,** ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්**,** වාර්තාවේ 1.6.1 (ඇ) **(iii)** ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු සැපයීමට කටයුතු කරනු ලබන බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (i) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104 (3) (4)** වගන්ති | - | වාහන අනතුරු සම්බන්ධව පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07කට වඩා වැඩි ප්‍රමාදයක් සිදුවේ යැයි අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්ථාවක් වහාම එවීමට කටයුතු කල යුතු අතර අලාභය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුලත දී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවද 2021,2022 වර්ෂවල සිදුවූ අලාභයේ වටිනාකම රු.4,418,108 ක් වූ අනතුරු 18ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 2017දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රජයට අයත් සෑම රථයක්ම භාවිතා කරන ආයතනය නමින් ලියාපදිංචි කළ යුතු වුවත් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල වාහන 08 ක් භාවිතා කළද ඒ සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුල භාවිතයෙන් ඉවත් කල වාහන 2022 වර්ෂය වනතෙක් අපහරණය කිරීමක් සිදු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(iv)** | 1980 සැප්තැම්බර් 09 දිනැති අංක මු/7/63 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛය<br>07 ඡේදය | පාසල් 40 ක නියැදි පරීක්ෂාවේදී පාසල් 6 ක ශිෂ්‍ය නේවාසිකාගාරයට සිසුන් ඇතුළත් කර ගැනීමේදී, ලබා ගන්නා තැන්පතු මුදල ශිෂ්‍ය නේවාසිකාගාරය හැර යන අවස්ථාවේදී ගෙවීම හෝ අවසාන මාසයේ නේවාසිකාගාර ගාස්තුව වෙනුවෙන් හිලව් කිරීම හෝ කළ යුතු වුවද එපරිදි සිදු කර නොතිබුණි. | විදුහල්පතිවරුන් වෙත නැවත නව චක්‍රලේඛය මගින් දැනුවත් කිරීමට අපේක්ෂිතය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(v)** | 2012 සැප්තැම්බර් 22 දිනැති අංක 2012/34 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛය<br>1.2 ඡේදය | කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසලක පිහිනුම් තටාකය ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකයින් පිරිසක් අධ්‍යක්ෂක මණ්ඩලය ලෙස සේවය කරන, සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද පුද්ගලික සමාගමක් විසින් කළමනාකරණය කරන බවත් පිහිනුම් තටාකය මගින් වාර්ෂිකව විශාල ආදායමක් ලබා ගන්නා බවත්, පිහිනුම් තටාකය පිහිටි පරිශ්‍රයේ ආදි ශිෂ්‍ය සංගමයේ වියදමින් වර්ග අඩි 12000 කින් පමණ සමන්විත තෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කර එම තෙමහල් ගොඩනැගිල්ල බාහිර පාර්ශවයන් වෙත ලබාදී ඒ තුළින්ද විශාල ආදායමක් ලබා ගෙන තිබූ බවත් නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නැත | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(vi)** | 2022 ඔක්තෝබර් 04 දිනැති අංක එම්ආර්ඩී/ඊකිව්ඩී/2 002/26 දරන අධ්‍යාපන අමාත්‍යාංශ | විදේශගත නිවාඩු ලබා ඇති සිසුවෙකු වසරකට වඩා වැඩි කාලයක් තුළ නැවත දිවයිනට නොපැමිණෙන්නේ නම් අදාල සිසුන් සඳහා දිගින් දිගටම පුරප්පාඩු තබා නොගත යුතු බව සඳහන්ව තිබුණද ගාල්ල මහින්ද විද්‍යාලයේ 2,3, සහ 4 | පිළිතුරු ලබා දී නැත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | චක්‍රලේඛය 02(V) ඡේදය | ශ්‍රේණිවල ඉගෙනුම ලබමින් සිටි සිසුන් 16 දෙනෙකු විදේශගත වී වසරකට අධික කාලයක් ඉක්මවා ඇතත්, එම සිසුන් වෙනුවෙන් දිගින් දිගටම පුරප්පාඩු තබාගෙන තිබුණි. | | |
| **(vii)** | 2008 සැප්තැම්බර් 19 දිනැති අංක 2008/37 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛය<br>2.1 ඡේදය (අ) | 2 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා පන්තිවල ශිෂ්‍ය සංඛ්‍යාව,පළමුවන ශ්‍රේණියට ඇතුළත් වන අවස්ථාවේදී එම පන්ති වලට ඇතුළත් කළ ශිෂ්‍ය සංඛ්‍යාවට සීමා කළ යුතු වුවද මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි ජාතික පාසලක පන්ති 15ක ශිෂ්‍ය සංඛ්‍යාව 1 සිට 7 දක්වා නියමිත සීමාව ඉක්මවා තිබුණි. | පිළිතුරු ලැබී නැත | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ආ) | **6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය** දක්වා පන්ති 15ක සිසුන් 1 සිට 7 දක්වා සීමාව ඉක්මවා තිබුණි. | | |
| **(viii)** | 2015 අගෝස්තු 21 දිනැති අංක 1928/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාව අනුව ලැයිස්තුගත ජාතික පාසල් 64ක් සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරින් විදුහල්පතිවරුන් වශයෙන් පත් කළ යුතුව තිබුණ නමුත් පාසල් 30 කට අදාළව එපරිදි පත්කිරීම් සිදු කර නොතිබුණි. | අධ්‍යාපන පරිපාලන සේවයේ 1පන්තියේ විදුහල්පති තනතුරුවල පුරප්පාඩු පවතින තනතුරු 34 ක් සඳහා 2023.06.06 හා 2023.06.07දින සම්මුඛ පරීක්ෂණ පවත්වා විදුහල්පතිවරුන් පත් කිරීමට නියමිත බව. | ලැයිස්තුගත ජාතික පාසල් සඳහා ගැසට් පත්‍රය ප්‍රකාරව විදුහල්පතිවරුන් පත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.5 වංචනික ස්වරූපයේ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ නිල්වලා විද්‍යාපීඨය විසින් බාහිර ආයතන වෙත සැපයූ සේවා වෙනුවෙන් අයකරන ලද රු.589,900 ක මුදලක් විද්‍යාපීඨයේ නිල බැංකු ගිණුමට බැර කර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | අයකරන ගාස්තු/ ආදායම් විද්‍යාපීඨයේ නිල බැංකු ගිණුමට බැර කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.6 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) ප්‍රකාරව අතුරු අග්‍රිම උපරිම සීමාව ඉක්මවා අවස්ථා 14 කදී එකතුව රු. 3,749,230 ක් ගෙවීම් කර තිබූ අතර අග්‍රිම නිකුත් කිරීම මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් සීමා විය යුතු වුවද එකතුව රු. 2,541,986 ක් වූ අත්තිකාරම් අවස්ථා 39 කදී මාණ්ඩලික නොවන නිලධාරීන් 7දෙනෙකුට නිකුත් කර තිබුණි. තවද මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්යය නිමවූ වහාම පියවිය යුතු වුවද එකතුව රු. 1,252,347 ක් වූ අග්‍රිම 38 ක් ආපසු පියවීමට දින 14 සිට දින 134 අතර කාල පරාසයක් ප්‍රමාද වී තිබුණි. | පිරිවෙන් අංශය අඩු මාණ්ඩලික නිලධාරීන් සංඛ්‍යාවකින් යුක්ත වීම මත මාණ්ඩලික නොවන නිලධාරීන්ට අත්තිකාරම් නිකුත්කර ඇති අතර මෙම තත්ත්වය ඉදිරියේදී ඇති නොවීම සඳහා කටයුතු කරන බව. තත්කාර්ය අතුරු අග්‍රිම කිහිපයක් පියවීම සඳහා දීර්ඝ කාලයක් ගත වි ඇති අතර ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් ඇති නොවීම සඳහා අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට පියවර ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු සිදු කළ යුතුය. |

## 2.7 තැන්පත් ශේෂයන්

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව තැන්පත් කල දින සිට වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට තැන්පතු ගිණුම් 05ක එකතුව රු.373,724,038ක් රාජ්‍ය ආදායමට බැර නොකර පැවති අතර ඒ තුළ වර්ෂ 5ක් ඉක්ම වූ රු.32,581,899 ක ශේෂයක් ඇතුළත් වී තිබුණි. | **මෙම ශේෂ නිරවුල් කිරීමට අදාළ ආයතන වෙත දැනුම් දී ඇති අතර දැනට නිරවුල් වී ඇති ප්‍රමාණය මාසයක් ඇතුළත විගණනය වෙත වාර්තා කිරීමට කටයුතු කරන බව.** | **මුදල් රෙගුලාසි ප්‍රකාරව තැන්පතු ශේෂ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම.** |

| | | | |
|---|---|---|---|
| (ii) | දේශීය උපාධි අපේක්ෂක සිසුන් වෙනුවෙන් විදේශීය ශිෂ්‍යත්ව ලබා දීම සඳහා 2021 ජූනි 25 වන දින චීන තානාපති කාර්යාලයෙන් ලබා දී තිබූ රු.1,810,000ක මුදලක් අදාළ ප්‍රතිලාභීන් වෙත ලබාදීමකින් තොරව වාර්තාවේ දිනය දක්වාම පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා ගෙන තිබුණි. | **විශ්වවිද්‍යාලවලින් නාම යෝජනා කැඳවා ඇති අතර නාම යෝජනා ලද පසු මෙම ශිෂ්‍යත්ව ප්‍රදානයන් සිදු කිරීමට නියමිත බව.** | **අදාළ ප්‍රතිලාභින් වෙත වහාම ශිෂ්‍යත්ව ලබා දීමට කටයුතු කළයුතුය** |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 දැක්ම හා මෙහෙවර**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශ කාර්යභාරය අනුව ලෝක තරඟකාරීත්වයට ආත්ම විශ්වාසයකින් හා සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතුව ප්‍රවේශ වීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීමේ කාර්යය සම්පූර්ණයෙන් ඉටු කිරීමට 2022 වර්ෂය තුළදීද නොහැකි වී තිබුණි. | විෂය මාලා ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කළ අතර ඒ සඳහා කැබිනට් අනුමැතිය ලැබුනද 2023.03.13 දිනැති ජනාධිපති ලේකම්ගේ අංක PS/SAD/Education/2023 දරන ලිපිය අනුව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අතහිටුවා ඇති බව. | සිසු පරපුරේ උන්නතිය උදෙසා වර්තමාන ලෝකයට ගැලපෙන ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කළ යුතුය. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | විශේෂ අධ්‍යාපන අවශ්‍යතා හා විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා අධ්‍යාපන පහසුකම් සැපයීම ඇතුළුව ළමයින් සඳහා අන්තර්කරණය අධ්‍යාපනය ලබාදීම පිළිබඳ අංක 37/2020 දරන චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය 2020 දෙසැම්බර් 03 දින නිකුත් කර තිබුණද උපදෙස් සංග්‍රහයේ ඇතුළත් කාර්යයන් ඉටුකිරීමට නොහැකි වී තිබුණි. | විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ට අන්තර්කරණ අධ්‍යාපනයක් ලබා දීම 2023 වර්ෂයේදී ආරම්භ කර ගුරු මාර්ගෝපදේශවලට අදාළව පළාත්වල ගුරුවරු පුහුණු කරමින් පවතින බව. දිනපතා නිවසින් බැහැර වීමට අපහසු ආබාධිත සිසුන් සඳහා ඉගැන්වීමට අන්තර්කරණ අධ්‍යාපනය ගුරු මාර්ගෝපදේශ සකස් කර ඇති බව. අධ්‍යාපනය ලබා දීමට අවශ්‍ය පරීක්ෂණ ක්‍රම අන්තර්ජාතිකව පිළිගන්නා ආකාරයට සකස් කිරීමට පියවර ගනිමින් පවතින බව. | චක්‍රලේඛය ප්‍රකාරව උපදෙස් සංග්‍රහයේ ඇතුළත් කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | 2022 වර්ෂය තුල අවසන් කිරීමට සැලසුම් කරන ලද කාර්යයන් අතුරින් කිසිදු ප්‍රගතියක් ලඟාකර නොගත් අංශ 12කට අයත් කාර්යයන් 30 ක් පමණ වූ අතර, ඒවායේ ඇස්තමේන්තු වටිනාකම රු.793,372,000 ක් විය. | මුදල් අමාත්‍යාංශයේ 2022.04.26 දිනැති අංක 03/2022 චක්‍රලේඛය, විවිධ හේතූන් මත 2022 වර්ෂයේ දී ණය ගිවිසුම් අත්සන් කිරීමට නොහැකි වීම, අත්‍යාවශ්‍ය පරිදි අක් මුදල් නොලැබීම ,COVID – 19 වසංගත තත්ත්වය හා රටෙහි ආර්ථික තත්ත්වය වැනි හේතු මේ සඳහා බලපා ඇති බව. | ප්‍රයෝගිකව ක්‍රියාත්මක කල හැකි ලෙස සැලසුම් සකස් කර, සකස් කරන ලද සැලසුම් ක්‍රියාත්මක කර අදාළ අරමුණු ළගා කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| **(iii)** | 2021 වර්ෂයේ දී පිරිවෙන් අධ්‍යාපන ශාඛාව විසින් ශබ්දාගාරයක් සකස් කර ඒ මගින් පිරිවෙන් විෂය නිර්දේශ ආවරණය වන සේ වීඩියෝ පාඩම් මාලාවන් සකස් කිරීම, යූ ටියුබ් නාලිකාව සඳහා අවශ්‍ය වීඩියෝ නිර්මාණය කිරීම, දිවයිනේ විවිධ දක්ෂතා ඇති පිරිවෙන් සිසුන්ගේ ධර්ම දේශනා හා වෙනත් නිර්මාණාත්මක වැඩසටහන් පටිගත කිරීම හා ප්‍රචාරය කිරීම යන කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් පිරිවැය රු.1,315,070 ක් වූ උපකරණ ලබාගෙන තිබුණද ශබ්දාගාරය සකස් කර නොතිබුණි. | ශබ්දාගාරය සකස් කිරීමට සුදුසු ස්ථානයක් ලබා ගැනීම සඳහා උත්සාහ කළත් ස්ථානයක් සොයා ගැනීමට නොහැකි වූ අතර, මේ වන විට ශබ්දාගාරය සඳහා මිලදී ගත් සියලුම උපකරණ අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | ශබ්දාගාරය පිහිටුවීමට සුදුසු ස්ථානයක් තෝරා ගැනීමට පෙර උපකරණ මිලදී ගැනීමට තීරණ ගත් නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| **(iv)** | අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ස්ථාපිත අරමුණු අතර උසස් අධ්‍යාපනය සම්බන්ධ අවස්ථා හා පිවිසුම් වැඩි කිරීම හා ගෝලීය සම්බන්ධතා සහ හුවමාරු කිරීම් වර්ධනය කිරීම ප්‍රධාන වේ. මේ යටතේ ලාංකික සිසුන් සඳහා ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව පිරිනැම්මේ කාර්ය විධිමත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මාර්ගෝපදේශයන් නිකුත් කර නොතිබූ අතර අමාත්‍යාංශය විසින් තෝරාගත් සිසුන්ගේ නම් අදාළ විශ්වවිද්‍යාලය වෙත යොමු කිරීමෙන් පසු එම විශ්වවිද්‍යාල විසින් තෝරා ගනු නොලබන සිසුන් හේතුවෙන් ඇතිවෙන පුරප්පාඩු සඳහා නැවත සිසුන් යොමු කිරීමේ ක්‍රමවේදයක් මෙන්ම ශිෂ්‍යත්වලාභීන් ලෙස අදාළ විශ්ව විද්‍යාලය විසින් තෝරා ගැනිමෙන් පසුව අදාළ ශිෂ්‍යයන් වෙත පිරිනමනු ලබන උපාධි පිළිබඳ පසු විපරම් කිරීමේ ක්‍රමවේදයක් ද නොපැවතුණි. | වාර්ෂිකව මාර්ගෝපදේශයක් සකස් කිරීම සම්බන්ධයෙන් වන මූලික කටයුතු සිදු වෙමින් පවතින බව.<br><br>විදේශ ශිෂ්‍යත්ව සඳහා විශ්වවිද්‍යාල විසින් තෝරා ගැනීමෙන් පසුව අදාළ ශිෂ්‍යත්වලාභීන් වෙත පිරිනමනු ලබන උපාධි සම්බන්ධයෙන් වන පසු විපරම් කිරීමේ ක්‍රමවේදය මෙම වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බව. | ශිෂ්‍යත්ව පිරිනැමීමේ කාර්ය විධිමත් කිරීම සඳහා මාර්ගෝපදේශයන් නිකුත් කිරීමට කටයුතු කිරීම හා පසු විපරම් කිරීම සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(v)** | විශේෂ අවශ්‍යතා ඇති ළමුන් වෙනුවෙන් කහතුඩුව වෙනිවැල්කොළ ප්‍රදේශයේ රු.247,252,882 ක වියදමක් දරා විශේෂ අධ්‍යාපන මධ්‍යස්ථානයක් නිර්මාණය සහ ඉදිකිරීම් (Design & Built) ක්‍රමයට ඉදිකිරීමට 2017 වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවකුට ලබාදී තිබුණද අවශ්‍යතාවය ඇති ළමයින්ට උචිත ලෙස සකස් කර නොතිබූ බව පසුව හඳුනාගෙන තිබූ නමුත් කොන්ත්‍රාත් ප්‍රදානය ට පෙර තම අවශ්‍යතාවය ගැන සැලකිලිමත් වී නොතිබුණි. | නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන අංශය වෙතින් මෙම විශේෂ අධ්‍යාපන ඒකකයේ ස්ථාපනය කළ යුතු අවශ්‍යතාවයන් පිළිබඳව ලැයිස්තුවක් ලබා ගෙන ඒ අනුව වාර්ෂික වෙන්වන ප්‍රතිපාදන ප්‍රමාණය ද සැළකිල්ලට ගෙන ගොඩනැගිලි ඉදි කිරීමට තීරණය කර ඇති බව. | අවශ්‍යතාවයට අනුගත වෙමින් කොන්ත්‍රාත් ඉටුකරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(vi)** | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය 2020 වර්ෂයේ පිහිටුවා 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා එකතුව රු. 5,219,297,390 ක් වැය කර තිබුණද සැලසුම් කළ පරිදි ජාතික අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් සිදු කිරීමට අපොහොසත් වී තිබුණි. 2022 වර්ෂයේ රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී තිබුණු අතර විෂය පථයට අයත් ව තිබූ කාර්යයන් හා කර්තව්‍යයන් එදින සිට අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පවරා තිබුණි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් වෙනුවෙන් පසුගිය වර්ෂ 03 තුළ දී රාජ්‍ය අමාත්‍යාංශය විසින් දරන ලද මුදල හා ජාතික අධ්‍යාපන ආයතනය විසින් දැරූ රු.350,552,393 ක වියදමද නිෂ්කාර්ය වියදමක් වීමේ අවධානමක් පවතින බව නිරීක්ෂණය කෙරේ. | 2023.03.13 දිනැතිව ජනාධිපති කාර්යාලය විසින් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් නිකුත් කරන ලද PS/SAD/Education/2023 අංක දරන ලිපිය මඟින් යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවන ලෙස උපදෙස් ලැබී ඇත. අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මේ වන විට පත්කර ඇති කැබිනට් අනුකමිටුව මඟින් ලබා දෙන තීරණ අනුව ඉදිරියේදී නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට නියමිත බව. | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ ඇති වැදගත්කම සැලකිල්ලට ගෙන ඊට ප්‍රමුඛතාවයක් ලබා දිය යුතුය. |
| **(vii)** | මෙරට 353ක් වූ ජාතික පාසල් සංඛ්‍යාව දහසක් (1000) දක්වා ඉහළ නැංවීම අරමුණු කරගෙන ඇති කළ වැඩ සටහන යටතේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විවෘත විශ්ව විද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2021 වර්ෂය තුළදී පාසල් 622 ක අන්තර්ජාල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් රු.මිලියන 576 ක් ද කාන්තා හා ළමා සංවර්ධන පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය මඟින් පාසල් 831 ක් සඳහා භෞතික යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් රු.මිලියන 44.7ක් ද උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් රු.මිලියන 20.5 ක් ද | කිසිඳු ජාතික පාසලක් නොමැති ප්‍රාදේශීය කොට්ඨාසවල පාසල් 125 ක් පමණක් සංවර්ධනය කිරීමට නියමිත අතර මේ පිළිබඳ ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ තීරණය මත ඉදිරි කටයුතු කිරීමට නියමිත බව. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කර රාජ්‍ය මුදල් ඵලදායි ලෙස වැය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලෙස රු.මිලියන 2285.2 ක් වැයකර තිබුණද පාසල් 22 ක් පමණක් ජාතික පාසල් බවට පත්කර තිබුණි. | | |
| **(viii)** | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේදී සකස් කළ පෙර පාසල් අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් සැලසුම් කළ කාර්යයන් සම්පූර්ණ කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි. | පෙර පාසල් ප්‍රතිපත්තියට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් කෙටුම්පත් කර ඇත. අධ්‍යාපන ලේකම්ගේ 2023.02.06 දිනැති අනුමැතියෙන් මෙම ජාතික ප්‍රතිපත්තිය හා ඊට අදාළ ඉදිරි සැලැසුම් ක්‍රියාත්මක කිරීමේ ඉදිරි කාර්යයන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව වෙත පවරා ඇති බව. | සැලසුම් කළ පරිදි පෙර පාසල් අධ්‍යාපන ප්‍රතිපත්තිය සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ix)** | ශ්‍රී ලංකාවේ සමස්ථ ගුරු කාර්ය මණ්ඩලයම උපාධිධාරීන් බවට පත් කිරීම, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ විශ්වවිද්‍යාල පීඨ තත්වයට උසස් කිරීම යන මැයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2019 දෙසැම්බර් 02 දින ඉදිරිපත් කර තිබූ අතර ඒ සඳහා වූ ප්‍රතිපත්තිමය අනුමැතිය 2019 දෙසැම්බර් 31 දින අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ලබා දී තිබුණ නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් සාකච්ඡා මට්ටමේ පමණක් පැවතුණි. | අධ්‍යාපන අමාත්‍යාංශයේ විද්‍යාපීඨ ශාඛාව ඊට අදාළ අනෙකුත් ආයතන හා සම්බන්ධීකරණය වෙමින් විද්‍යාපීඨ, විශ්වවිද්‍යාල මට්ටමට උසස් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධ කටයුතු සිදු කරමින් පවතින බව විද්‍යාපීඨ පාඨමාලා සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද කැබිනට් අනුකමිටුවේ තීරණ ප්‍රකාරව ආරම්භ කිරීමේ හැකියාවක් පවතින බව. | ගුරු කාර්ය මණ්ඩල යේ උන්නතිය උදෙසා කටයුතු කළ යුතුය. |
| **(x)** | 2019 වර්ෂයේ සිට හඳුනාගන්නා ලද ජාතික වෘත්තීය පහසුකම් මට්ටම් 07 කින් යුත් වර්තමාන ක්‍රමය මට්ටම් 10 දක්වා වැඩි කිරීම හා 2020 වර්ෂයේ සිට හඳුනාගෙන තිබූ පශ්චාත් උපාධි මට්ටම දක්වා වෘත්තීය අධ්‍යාපනය හැදෑරීමට අවස්ථා ලබාදීම යන කාර්යයන් 2023 ජූලි 31 දක්වාම ඉටුකර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | සැලසුම් කල පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය. |

**3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | 2018 අයවැය යෝජනාවක් මත වෛද්‍ය උපාධි අපේක්ෂකයන් සංඛ්‍යාව 300 කින් වැඩි කිරීම ඇතුළුව ඉලක්ක කිහිපයක් ළඟාකර ගැනීමේ අරමුණ මත 2019 ජූනි 24 දින | මෙම ව්‍යාපෘතීන් සඳහා ප්‍රමාණවත් අක් මුදල් නොලැබීම හේතුවෙන් නියමිත කොන්ත්‍රාත්කරුට සිදුකරන ගෙවීම් කාලපරිච්ඡේදය තුළ | |

| | | | |
|---|---|---|---|
| | මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම වෙත කරාපිටිය රෝහලේ මහාචාර්ය ඒකකය පිහිටුවීමේ ව්‍යාපෘතිය පිරිනමා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2022 ජූනි 16 දින වැඩ නිම කිරිමට අපේක්ෂා කර තිබූ මෙම ව්‍යාපෘතිය සඳහා අවස්ථා කිහිපයකදී දින දීර්ඝ කිරිම් ලබා දී තිබුණද 2023 පෙබරවාරි 15 වන දින වන විටත් මහල් 06 ක් දක්වා අභ්‍යන්තර ව්‍යුහය සකස් කිරිමේ කටයුතු පමණක් සිදු කොට තිබුණි. | ප්‍රමාද වීම ද සිදු වූ බව. ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල උච්ඡාවචනය හා වෙළඳපොළ තුළ ඉදිකිරීම් ද්‍රව්‍යවල පවතින හිඟකම යන කරුණු හේතුවෙන් ඉදිකිරීම් කටයුතු මන්දගාමී ස්වරූපයක පැවතුණු බව. මේ වන විට ඉදි කිරීම් කටයුතුවල සියයට 55 ක භෞතික ප්‍රගතියක් අත්කර ගෙන ඇති බව. | ව්‍යාපෘති කටයුතු නිමකර අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ii)** | රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් 12 ක ගොඩනැගිල්ලක් ඉදි කිරිම. | | |
| | කරාපිටිය වෛද්‍ය පීඨයට ඇතුලත් කර ගන්නා සිසුන් සංඛ්‍යාව වැඩි කිරිම හා පර්යේෂණ ධාරිතාවය (Research Capabilities) වැඩි කිරිමේ අරමුණ සහිතව රසායනාගාර, විභාග හා දේශන ශාලා පහසුකම් වැඩි කිරිම වෙනුවෙන් රු. මිලියන 1,092 ක කොන්ත්‍රාත් වටිනාකමක් සහිතව 2020 ජූනි 01 වන දින මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ උපදේශන කාර්යංශය වෙත මෙම කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2021 සැප්තැම්බර් 06 වන දින වැඩ නිම කිරිමට අපේක්ෂිතව තිබුණ ද 2023 ජනවාරි 15 දින දක්වා දින දීර්ඝ කිරිම් ලබා දී තිබූ නමුත් 2023 පෙබරවාරි 15 දින වන විට මෙම ව්‍යාපෘතියේ මහල් 08 ක් දක්වා Slab දැමීම සිදුකර, 03 වැනි මහල දක්වා පමණක් අභ්‍යන්තර ව්‍යුහය සකස් කිරිමේ කටයුතු සිදුකර තිබුණි. | වර්තමාන භෞතික ප්‍රගතිය සියයට 49 ක් වේ. මෙම කොන්ත්‍රාත්තුව CECB ආයතනයට ලබා දුන් පසු 2020 දෙසැම්බර් සිට 2022 ජූනි දක්වා උද්ගතව තිබූ කොවිඩ් වසංගතය සහ ඉන් අනතුරුව රට තුළ ඇති වූ ආර්ථික අර්බුදය හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු මන්දගාමී තත්ත්වයක පැවතුණු බව ඊට අමතරව, කොන්ත්‍රාත්කරුට නියමිත වේලාවට ගෙවීම් සිදු කිරීමට ප්‍රමාණවත් පරිදි මුදල් නොලැබීමද මේ සඳහා හේතු වූ බව. | එලඹෙන ලද ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘතිය නිම කිරීමට හැකි සෑම උත්සාහයක්ම ගත යුතු අතර දින දීර්ඝ කිරීම් අවම කර ගත යුතුය. |
| **(iii)** | රුහුණු විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයක් ස්ථාපිත කිරිමේ ව්‍යාපෘතිය | | |
| | සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ වෛද්‍ය රසායනාගාර පුහුණුලාභීන්ගේ පවතින විශාල හිඟය හේතුවෙන් ඇති වී තිබෙන ගැටළුකාරී තත්ත්වය මගහරවා ගැනීමේ අරමුණ සහිතව මෙම ව්‍යාපෘතිය සඳහා ගොඩනැඟිලි 3ක් ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව 2020 දෙසැම්බර් 03 දින පුද්ගලික සමාගමකට රු. මිලියන 1,501 කට ප්‍රදානය කර ඇති අතර 2023 ජූනි 02 දින | මෙම ගොඩනැගිල්ල **A, B, C** වශයෙන් කොටස් **03** කින් සමන්විත වන අතර ඒ අනුව, **Block – A**, **B** සහ **C** හි ප්‍රගතිය පිළිවෙලින් සියයට **58.1** ක්, **66** ක් සහ **67** ක් ලෙස ලැබුණු බව. | එලඹෙන ලද ගිවසුම් ප්‍රකාරව කටයුතු කර ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ ළඟා කර ගත යුතුවේ. |

| | | |
|---|---|---|
| නිම කිරිමට අපේක්ෂා කර තිබුණද නැවත 2023 ජූලි 14 දින දක්වා දින දීර්ඝ කිරිමක් ලබා දී තිබුණි. 2023 මැයි 31 දින වන විටත් මෙම ව්‍යාපෘතියේ භෞතික කාර්ය සාධනය සියයට 60 ක මට්ටමේ පැවතුණි. | | |
| **(iv)** කිලිනොච්චිය ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනයේ ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදිකිරීම | | |
| සිසුන් 400 දෙනෙකු සඳහා රු. මිලියන 300 ක සමස්ථ පිරිවැයක් යටතේ ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදිකිරීමට අනුමත කර තිබුණි. 2018 වර්ෂයේ වෙන් කරන ලද මුදලින් උපදේශක සේවා ගාස්තු ගෙවීම සඳහා රු. 6,028,015 ක මුදලක් වියදම් කර තිබුණු අතර, 2019 වර්ෂය සඳහා රු. මිලියන 100 ක මුදලක් වෙන් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් මෙම ඉදිකිරීම් කටයුතුවලින් මූලික කටයුතු පමණක් සිදුකර තිබුණි. | පිළිතුරු පසුව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | අපේක්ෂිත පරිදි ව්‍යාපෘති නිම කර අරමුණු ඉටු කර ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගත යුතු වේ. |

**3.4 විදේශාධාර ව්‍යාපෘති**

පහත සඳහන් නිරික්ෂණ කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **(i)** ද්විතියීක අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම. | | |
| අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2014 වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ක්‍රියාත්මක කිරීම සඳහා වූ විස්තීරණ යෝජනාවලියක ප්‍රතිඵලයක් ලෙස මෙම තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන (ICT Hub) ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව කොරියන් Exim බැංකු මූල්‍ය දායකත්වයෙන් මෙම මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා 2019 නොවැම්බර් මස 05 වන දින ඇ.ඩො.35,663,773 ක ණය ගිවිසුමකට එළඹ තිබූ අතර ජාතික මට්ටමේ එක් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක් හා පළාත් මට්ටමේ | වරින්වර ඉඩම් වෙනස් වූ බැවින් ව්‍යාපෘතිය ප්‍රමාද ද වූ නිසා අවසන් වශයෙන් තීරණය කරන ලද ඉඩම් යොදා ගනිමින් ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා අදාළ ශක්‍යතා අධ්‍යයනය නැවත සිදුකර එම වාර්තාව තුළ නව භූමි සම්බන්ධයෙන් ඇතුළත් කර එම වාර්තාව කොරියානු **EXIM** බැංකුවේද එකඟතාවය මත ණය ගිවිසුම සංශෝධනය සඳහා ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2023 වර්ෂය | ගිවිසුම්ගත වීමට පෙර සැලසුම් සකස් කිරීම,ස්ථාන තෝරා ගැනීම ආදිය නිම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මධ්‍යස්ථාන 02ක් ඉදිකිරීමට යෝජිතව තිබුණි. අදාළ මධ්‍යස්ථාන ඉදිකිරීමට යෝජිත ඉඩම් තාක්ෂණික කරුණු මත වරින්වර වෙනස් වීම හේතුවෙන් ව්‍යාපෘතිය සක්‍රීය කිරීමට නොහැකි වීමෙන් අත්සන් කළ ණය ගිවිසුම 2022 නොවැම්බර් 10 දින අහෝසි වී තිබුණි. | තුළ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට සැලසුම් කර ඇති බව. | |
| **(ii)** | ඉන්දියානු රජයේ ආධාර යටතේ වතු පාසල්වල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය<br><br>මධ්‍යම, ඌව, සබරගමුව හා දකුණ යන පළාත් වල තෝරාගත් වතු පාසල් 09 ක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 300ක් වටිනාකමැති ව්‍යාපෘතියට 2019 ජුනි 19 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබූ අතර, 2021 වර්ෂයේදී ඇස්තමේන්තු සකස් කර මිල ගණන් කැඳවා කොන්ත්‍රාත්කරු තෝරා ගෙන තිබුණද එම අවස්ථාවේ පැවති මිල ගණන් ඉහළ යාම නිසා කොන්ත්‍රාත් කටයුතු ඉටු කිරීමට නොහැකි වීම හේතුවෙන් 2023 වර්ෂය වන විට අවස්ථා කිහිපයකදීම ඇස්තමේන්තු සංශෝධනය සිදු කර තිබූ නමුත් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | වර්තමානයේ පවතින ආර්ථික අර්බුදය හමුවේ මෙම පාසල් 9හි යටිතල පහසුකම් සංවර්ධන කටයුතු රු.මි. 300 ව්‍යාපෘති වටිනාකමට සිදු කිරීම අපහසු බැවින් ව්‍යාපෘති වටිනාකම වර්තමාන විදේශ විනිමයට ගැලපෙන පරිදි සංශෝධනය කළ හැකිදැයි සලකා බැලීම සඳහා මේ වන විට ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සමඟ සාකච්ඡා කරමින් සිටින බව. | ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘතිය අවසන් කිරීමට හැකි සෑම උත්සාහයක්ම ගත යුතුය. |
| **(iii)** | තාක්ෂණ විෂය සඳහා වන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය ඉදිකිරීම.<br>අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2013 වසරේදී උසස් පෙළ විෂය ධාරාව සඳහා තාක්ෂණවේදය විෂය හඳුන්වාදීමත් සමඟ ඇති වූ ගුරු අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමේ අරමුණින් තාක්ෂණවේදය විෂය ධාරාව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක් කොරියානු රජයේ ආධාර යටතේ කුලියාපිටිය ප්‍රදේශයේ ඉදිකිරීමට 2017 ජනවාරි 18 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව ඇමරිකානු ඩොලර් මිලියන 14.95ක කොරියානු ජනරජයේ ආධාර සහ දේශීය අරමුදල් මගින් මෙම විද්‍යාපීඨය ස්ථාපනයට නියමිත ව තිබුණි.<br>වර්ෂ 05 ක පමණ කාලයක් ප්‍රමාද වීම හේතුවෙන් අන්තර්ජාතික කොරියානු සහයෝගීතා ඒජන්සිය **(KOIKA)** මෙම ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු වලින් ඉවත් වී එහි වගකීම අමාත්‍යාංශයට පවරා දී තිබූ අතර | 2021 දෙසැම්බර් මස CECB ආයතනය වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කර ව්‍යාපෘතියේ වැඩ කටයුතු සිදු කර ගෙන යනු ලබන අතර මේ වන විට භෞතික ප්‍රගතිය 35% ක් පමණ වේ. මෙම ව්‍යාපෘතිය සඳහා KOICA ආයතනයේ මූලික එකඟතාවය ඇමරිකානු ඩොලර් මිලියන 8 ක් වුවත් ව්‍යාපෘතිය ආරම්භ කිරීම ප්‍රමාද වීම සහ මේ වන විට උද්ධමනය වැඩිවීම මත ව්‍යාපෘතියේ සැලසුමට අනුව මුළු පිරිවැය ඩොලර් මිලියන 8 ඉක්මවා ගොස් ඇත. ඩොලර් මිලියන 8 ඉක්මවා යන මුදල ජාතික අයවැය | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඇ:ඩො: ලක්ෂ 08 ක මුදලක් 2021 දෙසැම්බර් මාසයේ මහා භාණ්ඩාගාරයට ලබා දී මෙම ඉදිකිරීම් කඩිනමින් අවසන් කළ යුතු බව එම ආයතනය දන්වා ඇති බැවින් මෙම කොන්ත්‍රාත්තුව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යංශය **(CECB)** වෙත ලබා දී තිබුණි. ඉදිකිරීම් කටයුතු 2022 දෙසැම්බර් මස ආරම්භ කර තිබු අතර නව කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුමට එළඹීමේදී **KOIKA** ආයතනය විසින් ලබා දෙන විදේශ ආධාර මුදල අභිබවා දැරීමට සිදුවන වියදම වෙනුවෙන් සහතිකයක් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ඉල්ලුම් කර තිබුණද ඒ සඳහා එළඹි තීරණයක් හෝ ගන්නා ලද ඉදිරි පියවරක් පිළිබඳ තොරතුරු නොතිබුණි. | දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගැනීමේ එකඟතාවය මත ගිවිසුම්ගත වී ඇත. | |
| **(iv)** | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බහු වාර්ගික හා ත්‍රෛභාෂා අධ්‍යාපනය සහිත නව ජාතික පාසලක් ඉදිකිරීම. | | |
| | පොලොන්නරුව දිස්ත්‍රික්කයේ බහුවාර්ගික හා ත්‍රෛභාෂා අධ්‍යාපනය සහිත නව ජාතික පාසලක් ඉදි කිරිම සඳහා 2017 ඔක්තෝබර් 25 දින රු.297,843,626 ක් වටිනා කොන්ත්‍රාත්තුවකට පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. 2018 වර්ෂයේදී රු.59,568,725 ක ප්‍රාරම්භක අත්තිකාරම් සහ රු. 8,935,309 ක එකතු කළ අගය මත බදු එම වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යාංශය වැය කර තිබුණි. ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාදය හේතුවෙන් 2020.01.22 දින එම ගිවිසුම අවසන් කර තිබුණු අතර එදිනට අය වීමට තිබු ප්‍රාරම්භක අත්තිකාරම් මුදල රු.40,850,633 ක් සහ එකතු කළ අගය මත බදු රු.6,127,600 ක් විය. එසේම ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය ප්‍රමාදයට අදාලව ඉල්ලුම්කල උපදේශන ගාස්තුව රු. 6,367,091 කි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට මෙහි ප්‍රගතිය සියයට 42 ක් වු අතර ව්‍යාපෘතිය අවසන් වන තෙක්ම ප්‍රමාද කාලයට උපදේශන ගාස්තු ගෙවීමට අමාත්‍යාංශයට සිදුවනු ඇත.<br>පළමු කොන්ත්‍රාත්කරු වෙත රු.111,043,064 | මෙම ඉදිකිරීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලයෙන් කරගෙන යනු ලබන අතර පළමු කොන්ත්‍රාත්කරුගේ දුර්වල ප්‍රගතිය නිසා කොන්ත්‍රාත්තුව අවලංගු කර ඇත. ඉන්පසු මෙම කොන්ත්‍රාත්තුව මධ්‍යම ඉංජිනේරු සේවා පෞද්ගලික සමාගම (CESL) වෙත පවරා දැනට ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතී. මෙහිදී කොන්ත්‍රාත්තුව අනුව ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් කොන්ත්‍රාත්කරුට අමාත්‍යාංශය විසින් VAT බදු මුදල් ගෙවීම සිදු කර ඇත. කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගතව ඇත්තේ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය බැවින් ගෙවන ලද VAT බදු මුදල් ආපසු අයකර ගැනීම | ව්‍යාපෘති කටයුතු ප්‍රමාදයකින් තොරව ගිවිසුම් ප්‍රකාරව සිදු කර අපේක්ෂිත අරමුණු ඉටු කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක් ගෙවා තිබූ අතර ඔහු ඉවත් වීමෙන් පසු රු.186,800,562 ක් වූ ඉතිරි වැඩ නිමකිරීමට 2022 ඔක්තෝබර් 18 දින රු.200,664,128 කට නව කොන්ත්‍රාත්කරුවකුට කොන්ත්‍රාත්තුව ලබා දී තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් පිරිවැය රු.13,863,566 කින් ඉහළ ගොස් තිබූ අතර එම කොන්ත්‍රාත් මුදල දින 191 ක කාලසීමාවකට යටත්ව තිබුණි. | සඳහා අදාළ පියවර ගන්නා ලෙස දැනුම් දී ඇති බව.<br><br>අමතර උපදේශක ගාස්තුව විචලනයක් බැවින් ඉල්ලීම් ලිපිය 2022.12.23 දින ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කර ඇත. ප්‍රසම්පාදන කමිටුවේ තීරණය මේ වන විට ලැබී නොමැති බැවින් අමතර ගෙවීමක් සිදු කර නොමැති බව. | |
| **(v)** | ආසියානු සංවර්ධන බැංකු (SESIP) ණය මුදල යටතේ ක්‍රියාත්මක ද්විතියික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩ සටහන | | |
| | • උක්ත වැඩ සටහන් සඳහා වෙන් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.800,000,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළ දැරූ මුළු වියදම රු.386,072,201කි. ඒ අනුව ඉතිරි වූ මුළු ප්‍රතිපාදනය රු.413,927,799 ක් බවත් එය මුළු ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 52 ක් බවත් නිරීක්ෂණය විය. 2022 වර්ෂය තුළදී අපේක්ෂිත ප්‍රධාන ඉලක්ක 2 ක් ලඟාකර ගැනීමට නොහැකි වී ඇති අතර ණය මුදල අඛණ්ඩව ලබාගැනීම සඳහා අපේක්ෂිත ඉලක්ක නියමික කාලරාමුව තුළ ලඟාකර ගත යුතුව පවතී. | 2022 ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රමාණවත් ප්‍රගතියක් වාර්තා නොවීමට 2022 වර්ෂයේ දෙවන කාර්තුව අවසන් කාලයේ එවකට රටේ පැවති මූල්‍ය අර්බුදය 2022 වසර අවසන් කාර්තුවේ ඇතැම් අංශයන් සඳහා අක් මුදල් නිදහස් කළද වසර අවසානයේ ගිණුම් පියවිය යුතු බැවින් සැලසුම් කරන ලද වැඩමුළු සංශෝධනය කිරීමට සිදු විම.<br><br>ජාතික අධ්‍යාපන ආයතනයේ (NIE) හා විභාග දෙපාර්තමේන්තුවේ ඇතැම් ක්‍රියාකාරකම් කොටස් 2023 වර්ෂයට කල් දැමීමද මෙම ඉතිරිවීම් වලට හේතුවක් විය. | ඉලක්කගත විසර්ජන සබැදි දර්ශකයන් නියමිත කාල රාමු තුල ලගා කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| | • ආසියානු සංවර්ධන බැංකු ණය මුදල හා ලෝක බැංකු ණය මුදල යටතේ ප්‍රතිපාදන සලසා තිබූ 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් තාක්ෂණ අධ්‍යාපන ශාඛාවේ ප්‍රධාන කාර්යභාරයන් 08ක් යටතේ උප ක්‍රියාකාරකම් 46 ක් වෙනුවෙන් ඇස්තමේන්තුගත වියදම රු.705,000,000 ක් වූ | 2022 වර්ෂයේ දී ක්‍රියාකාරකම් පෙළගස්වා තිබුණ ද සියලුම වැඩමුළු හා වැඩසටහන් මාර්ගගතව සිදු කිරීම, ඉන්ධන අර්බුදය, හා බොහෝ ප්‍රසම්පාදන කටයුතු විෂයමාලා ප්‍රතිසංස්කරණය හා සබැදි ඒවා වන බැවින් එම කටයුතුවල ප්‍රගතිය මන්දගාමී වීම වැනි | අපේක්ෂිත ඉලක්ක නියමිත කාල රාමු තුල ලගා කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතුය. |

| | | |
|---|---|---|
| ක්‍රියාකාරකම්වලට අදාළ ප්‍රගති වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේ දැරූ වියදම රු. 8,260,764 ක් විය. ඒ අනුව ළඟා කර නොගත් මූල්‍ය ප්‍රගතිය හේතුවෙන් මුළු වටිනාකමෙන් රු. 696,939,236 ක් හෙවත් සියයට 98 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | හේතු ප්‍රසම්පාදන අවශ්‍යතාව ක්‍රියාත්මක කිරීමට බාධා විය. එසේම මුදල් අමාත්‍යාංශයේ අංක 03/2022 දරන චක්‍රලේඛයද මේ සඳහා බලපා ඇත. ඒ අනුව ව්‍යාපෘතියේ දර්ශක අත්පත් කර ගැනීමේ කටයුතු මෙම වර්ෂය තුළ ආරම්භ කර ඇත. | |
| • ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව යටතේ ද්විතියික අධ්‍යාපනික ආංශික සංවර්ධන වැඩසටහනට අයත් විසර්ජන සබැඳි දර්ශක 03 වෙනුවෙන් රු. 380,000,000ක් වෙන් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මෙම ක්‍රියාකාරකමෙහි කිසිදු ප්‍රගතියක් ලබාගෙන නොතිබූ අතර තවමත් සැලසුම් කිරීමේ අදියරෙහි පමණක් පවතින බව නිරීක්ෂණය විය. | මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 03/2022 ට අනුව මෙම කාර්යය අත්හිටුවන ලදී. කෙසේ වෙතත් 2022 ඔක්තෝබර් මස සංශෝධිත අයවැය ඇස්තමේන්තුව මත මේ සඳහා මිලියන 380 ක පමණ ප්‍රතිපාදන වෙන් වී ඇති අතර සැලසුම් කරන ලද තාක්ෂණික උපකරණ ලැයිස්තුව මිල ගණන් ඉහළ යාම හා භාණ්ඩ ආනයනය සීමා වීම මත නැවත වරක් සංශෝධනය කිරීමට සිදු විය. එබැවින් ප්‍රසම්පාදන කටයුතු 2023 වර්ෂයේ ආරම්භ කර ඇත. | අපේක්ෂිත ඉලක්ක නියමිත කාල රාමු තුල ලගා කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතුය. |
| • ද්විතියක අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා තෝරාගත් පාසල් 750ක, ඉලක්කගත විෂයයන් 13ක සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා රු. 295,000,000 ක් අදියර 04කදී පාසල් 750ක් වෙත ලබා දී තිබුණු අතර 2022 අගෝස්තු 24 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 07/2022 දරන චක්‍රලේඛය ප්‍රකාරව එම මුදල් 2022 දෙසැම්බර් 31 දිනට වියදම් කර අවසන් කළ යුතු වුවද පාසල් වෙත ලබා දුන් ප්‍රදානයන්ගෙන් රු. 270,000,000 ක් එනම් සියයට 91 ක් 2022 වර්ෂයේ අවසන් කාර්තුව තුළදී ලබා දීම හේතුවෙන් අපේක්ෂිත ඉලක්ක 2022 දෙසැම්බර් 31 දිනට ලඟා කර ගැනීමට නොහැකි වී තිබුණි. | මහා භාණ්ඩාගාරයෙන් අක් මුදල් ලබා දීම ප්‍රමාද වීම හේතුවෙන් පාසල් වෙත අක් මුදල් ලබා දීම ප්‍රමාද වූ අතර ප්‍රදානය වියදම් කළ යුතු කාලය 2022.12.31 දින දක්වා දීර්ඝ කරමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලද අතර පසුගිය කාලයේ පාසල් පැවැත්වීම සම්බන්ධයෙන් පැවති ගැටළු සහගත තත්ත්වය සහ භාණ්ඩාගාරයෙන් මුදල් ලබා දීම ප්‍රමාද වූ බැවින් ප්‍රදානය වියදම් කළ යුතු කාලය නැවතත් දීර්ඝ කිරීමට අදාළව චක්‍රලේඛය සංශෝධනය කරමින් පවතින බව. | අපේක්ෂිත ඉලක්ක නියමිත කාල රාමු තුල ලගා කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතුය. |

**3.5 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ නමට ලියාපදිංචි කරන ලද මෝටර්රථ 212 ක් අධ්‍යාපන අමාත්‍යාංශය සතුව නොපැවතුණි. | අදාළ අමාත්‍යාංශය සහ ආයතන මඟින් තොරතුරු කැඳවීමේ ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | අමාත්‍යාංශ ලේකම්ගේ නමට ලියාපදිංචි වී ඇති වාහන නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.6 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | මුද්‍රා ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල පොත් වලින් කපාහැරීමේ ප්‍රකාශනයෙහි ආරම්භක ශේෂය ලෙස පෙන්වන රු.5,065,289 ක වටිනාකමට අදාළ හානි 10 ක අලාභ අයකර ගැනීමක් හෝ පොත්වලින් කපා හැරීමක් සමාලෝචිත වර්ෂය තුළ සිදුකර නොතිබුණි. | නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සිදු කරමින් පවතින බව. | අලාභ හානි සම්බන්ධයෙන් ප්‍රමාදයකින් තොරව නිසි පියවර ගත යුතුය. |
| **(ii)** | තක්සේරු දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 3.1 ක් ලෙස තක්සේරු කර තිබුණු රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ නිල නිවස 2018 සැප්තැම්බර් 07 දින හදිසියේ ගිනිගැනීමකට ලක් වී තිබූ අතර මෙම ගොඩනැඟිල්ලේ අගය හා මීපේ අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ මධ්‍යස්ථානයේ ශ්‍රවණාගාරය 2019 පෙබරවාරි 09 දින ඇතිවූ ගින්නකින් සිදුවූ රු.මිලියන 72 ක තක්සේරු වටිනාකමට වූ හානියට අදාළව මු.රෙ.104(4) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ වන විට 2022.11.20 දිනැතිව පත් කරන ලද නව පරීක්ෂණ මණ්ඩලය විසින් පරීක්ෂණ කටයුතු සිදු කරගෙන යනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු සිදු කළ යුතුය. |
| **(iii)** | 2013/2014 වර්ෂයේදී පත්තලගෙදර උපකරණ ගබඩාවේ රු. 12,905,806ක් ලෙස වාර්ථා ගතව ඇති අක්‍රමිකතාවය, 2015 වර්ෂයේ මීග/නිවුස්ටඩ් බාලිකා විදුහලේ සිදුවී ඇති බවට වාර්ථාවී ඇති කුවිතාන්සි පොත්වල සිදුවූ රු. 4,510,409 ක් වූ | මැයි 16 දින මූලික විමර්ශන වාර්තාවක් නිකුත් කර ඒ අනුව මු.රෙ 104(4) පරීක්ෂණ වාර්තාව සකස් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව පරීක්ෂණ මණ්ඩලයෙන් විමසීමේදී දන්වන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අක්‍රමිකතාවය හා මීගමුව හරිස්චන්ද්‍ර ජාතික පාසලේ පාසල් සංවර්ධන සමිතියට ලද මුදල් බැංකුගත කිරීමේදී සිදුවී ඇති අක්‍රමිකතාවයෙන් තවදුරටත් අයවිය යුතු රු.1,384,225 කට අදාළව එකතුව රු.18,800,440 ක් සම්බන්ධයෙන් මු.රෙ.104 පරිදි කටයුතු කිරීමට සමාලෝචිත වර්ෂය තුලදීද අපොහොසත් වී තිබුණි. | මීගමුව හරිස්චන්ද්‍ර ජාතික පාසලේ පාසල් සංවර්ධන සමිතියට ලද මුදල් බැංකුගත කිරීමේදී සිදුවී ඇති අක්‍රමිකතා සම්බන්ධයෙන් චෝදනා එල්ල වී ඇති මහත්මිය වෙතින් අදාළ අලාභය අයකර ගැනීමට කටයුතු කරන ලෙස පාසලේ විදුහල්පති දැනුවත් කර ඇති බව. තවද, මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය මගින් නීතිමය පියවර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | |
| **(iv)** | නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ දේශන ශාලාව අළුත්වැඩියා කිරීමේදී 2017 වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ සවිකරන ලද ආරක්ෂිත කැමරා පද්ධතිය විද්‍යාපීඨයේ කොන්ත්‍රාත්කරු විසින් අපරීක්ෂාකාරීව ගලවා ඉවත් කිරීම නිසා 2019 ඔක්තෝබර් මස සිට අක්‍රීය තත්ත්වයට පත්ව තිබූ අතර නැවත පිළිසකර කිරීම සඳහා රු.1,012,205 ක් ඇස්තමේන්තු කර තිබුණි. මෙම අලාභය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (3) හා (4) ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර, ආරක්ෂිත කැමරා පද්ධතිය නැවත ස්ථාපිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු සිදු කළ යුතුය. |

**3.7 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | 2016 පෙබරවාරි 11 දිනැති අංක අමප/16/0167/716/008 දරන කැබිනට් පත්‍රිකාවෙන් ජාතික විද්‍යා මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට ලබාදී තිබූ අනුමැතිය මත හෝමාගම පිටිපන පිහිටි නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් කොටස පවරා ගැනීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත රු. මිලියන 280 ක් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එහි අයිතිය අමාත්‍යාංශය වෙත ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිතුරු පසුව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | නාගරික සංවර්ධන අධිකාරිය සමග සාකච්ඡා කර ඉඩමේ අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම පිළිබද සැසඳුම් ප්‍රකාශය අනුව අමාත්‍යාංශයේ සිට අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු, පලාත් සභා වලට ස්ථාන මාරු වී ගිය, මිය ගිය, විශ්‍රාමගිය, වැඩ තහනම් කළ, සේවය හැර ගිය හා සේවයෙන් මුදාහල නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.162,053,327 ක් අය විය යුතු අතර ඉන් වර්ෂ 5 ඉක්මවූ ශේෂය රු.69,419,033 විය. වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පලාත් සභා වෙත නිරවුල් කළ යුතු ශේෂය රු.39,994,516 ක් වූ අතර ඉන් වර්ෂ 5 ඉක්මවූ ශේෂය රු. 24,586,484 ක් විය. එම ශේෂ අයකර ගැනීමට හෝ නිරවුල් කිරීමට හෝ සමාලෝචිත වර්ෂය තුළදී ද අපොහොසත් වී තිබුණි. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| **(iii)** | 2022 අප්‍රේල් 05 දිනැති අංක ED/1/27/15/01/2022 දරන ජාතික පාසල් ගුරු ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම් චක්‍රලේඛයේ 1.1 ඡේදය ප්‍රකාරව පාසලේ වර්ෂ 10ක් සම්පූර්ණ කළ ගුරුවරුන් වාර්ෂිකව අනිවාර්යය ස්ථාන මාරුවකට යටත් විය යුතු වුවද විගණිත ජාතික පාසල් 11 ක ගුරුවරුන් 244 දෙනෙකු සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | චක්‍රලේඛය ප්‍රකාරව ගුරු ස්ථාන මාරු කිරීම් සිදු කළ යුතුය. |
| **(iv)** | ගාල්ල මහින්ද විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් සිදුකරන ලද ඉල්ලීමකට අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති හා සැලසුම් අධ්‍යක්ෂකගේ 2016 අප්‍රේල් 11 දිනැති අංක ඊඩී/3/37/3/9/i-ii දරන ව්‍යුහ කමිටු වාර්තාවෙන් 2016 වර්ෂයේ දී පළමු ශ්‍රේණියට තවත් සමාන්තර පන්තියක් වැඩි කිරීමට අනුමැතිය ලබාදී තිබුණද, 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සමාන්තර පන්තියක් වැඩිකර නොතිබීම නිසා ශිෂ්‍යත්වය සමත් සිසුන් 45 දෙනෙකුට පාසලට ඇතුළත්වීමට තිබුණු ඉඩප්‍රස්ථාව අහිමි වී තිබුණි. | පිළිතුරු ලබා දී නැත | **5** ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සමත් සිසුන්ට සාධාරණත්වයක් වන පරිදි කටයුතු කිරීමට වගකිව යුත්තන්ගේ අවධානය යොමු විය යුතුය. |

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන හා 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව රාජ්‍ය ආයතනයක් වෙතින් සේවාවන් ලබන මහජනතාවට අවශ්‍යතාවයන් කඩිනම්ව, කාර්යක්ෂමව, ගුණාත්මකව හා අඛණ්ඩව ඉටු කරන බවට ලිඛිත බැඳීමක් ආකාරයෙන් සෑම රාජ්‍ය ආයතනයක්ම පුරවැසි- සේවාලාභි ප්‍රඥප්තියක් ස්ථාපිත කිරීම කල යුතු වුවද, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තියක් සකස් කර පවත්වාගෙන ගොස් නොතිබුණි. | අධ්‍යාපන අමාත්‍යාංශයේ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය මේ වන විට සකස් කරමින් පවතින බව. | චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි - සේවාලාභි ප්‍රඥප්තියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | විශේෂ අධ්‍යාපන අංශයක් ඇති පාසල්වල ළමුන් සහ ගුරුවරුන් 5:1 අනුපාතයට අනුව සිටිය යුතු වුවත් පලාත් 09 හි පාසල් 55 ක ගුරුභවතුන් 66 දෙනෙකුගේ අතිරික්තය හා පාසල් 212 ක පුරප්පාඩු 349 ක් පැවතුණි. තවද විශේෂ අධ්‍යාපනය සම්බන්ධව පුහුණුව සහිත ගුරු පත්වීම් ලබා සිටින නමුත් වෙනත් විෂයයන් ඉගැන්වීම් කටයුතු වල නිරත වන ගුරුභවතුන් 147 දෙනෙක් පාසල් 135ක සිටින බව නිරීක්ෂණය වූ අතර එම ගුරුභවතුන් සම්බන්ධයෙන් 2020 දෙසැම්බර් 13 දිනැති අංක 37/2020 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයෙහි උපදෙස් පත්‍රිකාවේ 12 ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අතිරික්ත ගුරුවරුන් පුරප්පාඩු සහිත පාසල් වෙත යොමුකර ගුරු තුලනය කිරීමට කටයුතු කරන බව. | ගුරු තුලනය ඇතිවන පරිදි කටයුතු කල යුතුය. |
| (ii) | 2020 නොවැම්බර් 19 දිනැති DMS/SM/ 12 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය ප්‍රකාරව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල දුරස්ථ අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා අනුමත කර තිබුණු කාර්ය මණ්ඩලය ඉක්මවා සංවර්ධන නිලධාරීන් 45 දෙනෙකු බඳවාගෙන තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | අනුමත කාර්ය මණ්ඩලය සඳහා පමණක් බඳවා ගැනීම් සිදු කළ යුතුය. |